# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන)

**(113 වන අධිකාරය වූ) උඩරට විවාහ හා දික්කසාද පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2022 ඔක්තෝබර් මස 03 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 සැප්තැම්බර් මස 07 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[153 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (113 වන අධිකාරය වූ) උඩරට විවාහ හා දික්කසාද පනතේ II වන කොටස ඉවත් කරනු ලබන අතර එහි නීතිය බලපෑම වනුයේ, බාලවයස්කරුවකුගේ විවාහය සඳහා නිසි බලධරයකුගේ කැමැත්ත ලබා ගැනීමේ අවශ්‍යතාවය ඉවත් කර එමගින් උඩරට නීතියට යටත් සියලු ම තැනැත්තන් සඳහා විවාහ වීමේ අවම වයස අවුරුදු දහඅටක් බවට පත් කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***6 වන වගන්තිය :*** මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***7 වන වගන්තිය :*** මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***8 වන වගන්තිය :*** මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***9 වන වගන්තිය :*** මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගිකව "බාලවයස්කරු" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කිරීම වේ.

එල්. ඩී.—ඕ. 73/2021

## (113 වන අධිකාරය වූ) උඩරට විවාහ හා දික්කසාද පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

**1.** මේ පනත 2022 අංක      දරන උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

113 වන අධිකාරයේ II වන කොටස ඉවත් කිරීම

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (113 වන අධිකාරය වූ) උඩරට විවාහ හා දික්කසාද පනතේ II වන කොටස (8 වන, 9 වන, 10 වන, 11 වන, 12 වන, 13 වන, 14 වන සහ 15 වන වගන්ති) මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (6) වන ඡේදයේ (ආ) අනුඡේදය ඉවත් කිරීමෙන්; සහ

(2) එහි (7) වන ඡේදයේ -

(අ) (අ) අනුඡේදයේ "නිවැරදි බව;" යන වචන වෙනුවට "නිවැරදි බව; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ආ) අනුඡේදයේ "නොමැති බව;" යන වචන වෙනුවට "නොමැති බව." යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) (ඇ) සහ (ඈ) අනුඡේද ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය, එහි (5) වන ඡේදය ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(5) (අ) මේ වගන්තියේ (3) (අ) (i) ඡේදයේ හෝ (4) (අ) (i) ඡේදයේ හෝ (4) (ඇ) (ii) ඡේදයේ සඳහන් කාලසීමාව

ඉකුත් වීමට පෙර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයකුගෙන් විවාහ දැන්වීම් සහතිකයක් ලබා ගැනීමට කැමැත්ත දක්වන විවාහයක යම් පාර්ශ්වයක් විසින්, ඒ රෙජිස්ට්‍රාර්වරයා ඉදිරියේ තමාම පෙනී සිට, විවාහයට නීතියෙන් පිළිගත් බාධාවක් හෝ නීතියෙන් පිළිගත් වෙනත් අවහිරයක් නොමැති බවට ප්‍රකාශයක් කර ඊට අත්සන් තබනු ලැබිය යුතු ය.

(ආ) ප්‍රකාශය කරනු ලබන පාර්ශ්වය විසින් ගෙවිය යුතු නියමිත ගාස්තුව ගෙවනු ලැබ ඇති බවට සාක්ෂියක් වශයෙන් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද ලදුපතක් ඒ ප්‍රකාශය සමග ඉදිරිපත් කළ යුතු ය.".

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ (3) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (අ) ඡේදයේ "නොමැති බව;" යන වචන වෙනුවට, "නොමැති බව; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (ආ) ඡේදය ඉවත් කිරීමෙන්; සහ

(3) එහි (ඇ) ඡේදය, (ආ) ඡේදය ලෙස නැවත අක්ෂර යෙදීමෙන්.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(1) උඩරට විවාහයක් සම්බන්ධයෙන් සැලකිලිමත් වන යම් තැනැත්තකු විසින්, ඒ විවාහයට අදාළව විවාහ දැන්වීම්

සහතිකයක් නිකුත් කිරීමට එරෙහිව ලිඛිතව විරුද්ධතාව දක්වනු ලැබිය හැකි ය."; සහ

(2) එහි (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ (ii) වන අනුඡේදය ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන්:—

"(ii) විරුද්ධතාව දක්වනු ලබන තැනැත්තා විසින් එසේ විරුද්ධතාව දක්වනු ලබන්නේ විවාහය සම්බන්ධයෙන් සැලකිලිමත් වන තැනැත්තකු වශයෙන් ද යන වග; සහ".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (1) වන ඡේදයේ -

(අ) (අ) අනුඡේදයේ "පදිංචිව සිටි බව;" යන වචන වෙනුවට "පදිංචිව සිටි බව; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ආ) අනුඡේදය ඉවත් කිරීමෙන්; සහ

(ඇ) (ඇ) අනුඡේදය, (ආ) අනුඡේදය ලෙස නැවත අකෂර යෙදීමෙන්; සහ

(2) එහි (2) වන ඡේදයේ -

(අ) (අ) අනුඡේදයේ "පදිංචිව නොසිටි බව;" යන වචන වෙනුවට "පදිංචිව නොසිටි බව; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ආ) අනුඡේදය ඉවත් කිරීමෙන්; සහ

(ඇ) (ඇ) අනුඡේදය, (ආ) අනුඡේදය ලෙස නැවත අක්ෂර යෙදීමෙන්.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය සංශෝධනය කිරීම*

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය මෙයින් ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"සාවද්‍ය ප්‍රකාශ ආදිය.

60. උඩරට විවාහයක් සිදුකිරීමට හෝ ලියාපදිංචි කිරීමට සැලසීමේ කාර්යය සඳහා දැන දැන ම හෝ ඕනෑකමින් ම මේ පනත යටතේ යම් සාවද්‍ය ප්‍රකාශයක් සිදුකර ඊට අත්සන් තබන හෝ යම් සාවද්‍ය දැන්වීමකට අත්සන් තබන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම*

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය, "බාලවයස්කරු" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*සැක දුරුකිරීම*

10. සැක දුරුකිරීම සඳහා -

(අ) මේ පනත ආරම්භ වන දිනට පෙරාතුව සිදු කරන ලද යම් උඩරට විවාහයකට, මේ පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු බව; සහ

(ආ) (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනතේ 112 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි හැර, ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධාන, මේ පනත ආරම්භ වන දිනයේ හෝ ඊට පසුව සිදු කරන ලද යම් උඩරට විවාහයකට අදාළ නොවිය යුතු බව,

මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව*

11. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.